ඇමුණුම 2

## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## සබරගමු පාසල් දරුවන් අනාගත ක්‍රමලේඛකයින් බවට පත්කිරීමේ අරමුණින් සබරගමු පළාත් ගරු ආණ්ඩුකාර අධිනීතිඥ නවීන් දිසානායක මැතිතුමාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක වන පරිගණක ශිෂ්‍යත්ව වැඩසටහන

### සිසුන් ඇතුළත් කරගැනීම - 2024

සබරගමු පාසල් දරුවන් සඳහා වන පරිගණක මූලික කරුණු පිළිබඳ වූ සහතිකපත්‍ර පාඨමාලාව (Certificate in Fundamentals of Computing) සඳහා සිසුන් බඳවා ගැනීම පිණිස අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් හා යෝග්‍යතාව සහිත සිංහල හා දෙමළ මාධ්‍යය අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- මේ සඳහා අයදුම් කළ හැකි වන්නේ සබරගමු පළාතේ පාසල් වල දැනට 10,11,12 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන් හා 2024 වර්ෂයේදී අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සිසුන්ට ය.

- සියලුම අයදුම්කරුවන් අයදුම් කිරීම සිදු කළ යුත්තේ මාර්ගගත ක්‍රමවේදය (Online System) ඔස්සේ පමණි. (ඩෙස්ක්ටොප් පරිගණක, ලැප්ටොප් පරිඝනක හා ස්මාර්ට් ජංගම දුරකථන භාවිතා කළ හැකිය)

- සැලකිය යුතු යි :- මාර්ගගත ක්‍රමය ඔස්සේ යොමුකරන අයදුම්පත භාගත කිරීමෙන් අනතුරුව පාසලේ විදුහල්පති මඟින් සහතික කළයුතු අතර මාර්ගගතව අයදුම්පත යොමු කිරීමේදි යම් වරදක් සිදුව ඇත්නම් එය විදුහල්පති විසින් නිවැරදි කිරීමෙන් අනතුරුව අයදුම්කරු විසින් ලියාපදිංචි තැපෑලෙන් තම පාසල අයත් කලාපයේ "නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (තොතුරු තාක්ෂණ)" වෙත අයදුම්පත් යොමු කළ යුතු වේ. (ලියුම් කවරයේ වම්පස ඉහළින් "Spark coders" ලෙස සඳහන් කරන්න)

- අයදුම් කරන අවස්ථාව වන විට යම් අයදුම්කරුවකු හට පෞද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනයක් **(Personal E-mail Address)** නොමැති නම් මාර්ගගත ක්‍රමවේදය (Online System) අනුව අයදුම් කිරීමට පෙර පෞද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනයක් සකස් කර ගැනීම අනිවාර්ය වේ.

- මාර්ගගත ක්‍රමය (Online system ) ඔස්සේ අයදුම් කිරීම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සිදු කළ යුතු වේ. ඒ අනුව අදාළ මාර්ගගත වැඩසටහනට පිවිසීම සඳහා https://sparkcoders.lk සබැඳිය හෝ QR කේතය ඔස්සේ මාර්ගගත වැඩසටහනට පිවිස අදාළ පියවර අනුගමනය කරමින් ඔබගේ අයදුම් කිරීම සිදු කළ යුතු වේ.

- පාඨමාලාවට සිංහල හා දෙමළ යන මාධ්‍ය දෙකෙන්ම අයදුම් කළ හැකි අතර එක් අයදුම්කරුවකු අයදුම් කළ යුත්තේ එක් මාධ්‍යයකින් පමණි.(දේශන පවත්වනු ලබන්නේ සිංහල හා දෙමළ මාධ්‍යයන් වලින් පමණි)

- අයදුම්කරුවන්ගේ ස්ථිර පදිංචි ස්ථානයට ආසන්නම මධ්‍යස්ථානය තෝරාගත යුතුය. ( (*මධ්‍යස්ථාන නාමාවලිය පහත දක්වා ඇත)

- එම මධ්‍යස්ථානය ඉල්ලුම්කරන ලද අයදුම්කරුවන් ප්‍රමාණවත් නොවන විට ආසන්නම වෙනත් මධ්‍යස්ථානයකට ඔවුන් යොමු කරනු ලබන අතර ඒ සඳහා අයදුම්කරු එකඟ විය යුතුය. එසේම මධ්‍යස්ථානයකට යොමුව ඇති අයදුම්පත් ප්‍රමාණය මධ්‍යස්ථාන ධාරිතාව ඉක්ම වූ විට තෝරාගැනීමේ පරීක්ෂණයක් මඟින් ඉහළම ලකුණු ලාභීන් තෝරාගනු ලැබේ.

- අයදුම්පත මාර්ගගතව යොමු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මෙහි දක්වා ඇත. එම පියවර අනුගමනය කරමින් අයදුම්පත පුරවන්න.

- මාර්ගගතව අයදුම්පත් යොමු කිරීම 2024 මැයි 31 දින අවසන් වේ. (Closing Date 2024.05.31)


➢ *මධ්‍යස්ථාන නාමාවලිය

| | |
|---|---|
| 1 | KG/MW/MOLAGODA JAYAPALA M.V |
| 2 | KG/BADDEWALA M.V |
| 3 | KG/PARAKRAMA M.V |
| 4 | KG/MW/MEDERIGAMA M.V |
| 5 | KG/MW/NAGARAGIRI M.V |
| 6 | KG/MW/ AL AZHAR COLLEGE. |
| 7 | KG/RIVISANDA CENTRAL COLLEGE |
| 8 | KG/MW/ DIPPITIYA RAJAGIRI M.V |
| 9 | KG/MW/DIPPITIYA.M.M.V |
| 10 | ITDLH MAWANELLA (INFORMATION TECHNOLOGY & DISTANCE LEARNING HUB) |
| 11 | KG/MW/ZAHIRA COLLEGE |
| 12 | KG/MW/GANETHENNA M V |
| 13 | KG/PINNAWALA CENTRAL COLLEGE |
| 14 | KG/BADURIYA C.C |
| 15 | ITDLH , KEGALLE (INFORMATION TECHNOLOGY & DISTANCE LEARNING HUB) |
| 16 | DUDLEY SENANAYAKA M.V. |
| 17 | ST.MARY'S TAMIL M.V. |
| 18 | KEGALU BALIKA M.V. |
| 19 | ST.JOSEPH'S B.M.V. |
| 20 | DEDIGAMA PARAKUMBA M.V. |
| 21 | WALAGAMA M.V. |
| 22 | GALIGAMUWA M.M.V. |
| 23 | ITDLH-GODAKAWELA (INFORMATION TECHNOLOGY & DISTANCE LEARNING HUB) |
| 24 | R/EMB/KULARATHNA M.M.V |
| 25 | R/EMB/CHANDRIKAWEWA JAYANTHI M V |
| 26 | R/EMB/KOLONNA N.S |
| 27 | R/EMB/DORAPANE M.V |
| 28 | R/EMB/KOLAMBAGEARA M.V |
| 29 | R/EMB/PRESIDENT COLLEGE |
| 30 | R/EMB/RAHULA N.S |
| 31 | R/GANKANDA.C.C |
| 32 | R/KURUVITA.C.C |
| 33 | ITDLH -KURUVITA (INFORMATION TECHNOLOGY & DISTANCE LEARNING HUB) |
| 34 | R/MALWALA.M.V |
| 35 | R/EHELIYAGODA.C.C |
| 36 | R/KIRIELLA.C.C |
| 37 | R/SEEVALI.C.C |
| 38 | R/ST.ALOYSIOUS.COLLEGE |
| 39 | ITDLH - BALANGODA (INFORMATION TECHNOLOGY & DISTANCE LEARNING HUB) |
| 40 | R/BG/VIDYALOKA M.V. |
| 41 | R/BG/ UDAGAMA M. V. |
| 42 | R/ BG/ WALAGAMBA M. V. |
| 43 | R/ BG/ VIDYAKARA M.V. |
| 44 | R/ BG/ KARAGASTHALAWA M.V. |
| 45 | R/ BG/ SRI NARADA M. V. |
| 46 | R/ BG/WELIPATHAYAYA M.V |
| 47 | R/ BG/ KANAGANAYAGAM M. V. |
| 48 | R/ BG/ JEILANI M. M. V. |
| 49 | ITDLH RUWANWELLA (INFORMATION TECHNOLOGY & DISTANCE LEARNING HUB) |
| 50 | ITDLH ATULUGAMA -DEHIOWITA (INFORMATION TECHNOLOGY & DISTANCE LEARNING HUB) |
| 51 | KE/ DEHI/ SIRISAMAN M. M. V. |
| 52 | KE/ DEHI/ DEHIOWITA NATIONAL SCHOOL |
| 53 | KE/ DEHI/ KALYANI M. V. |
| 54 | KE/ DEHI/ ROYAL M. V. |
| 55 | KG/DEHI/SULAIMANIYA.M.V |
| 56 | KG/DEHI/KATHIRESAN.M.V |
| 57 | KG/DEHI/SEELANANDA.M,V |
| 58 | KG/DEHI/INGIRIYAWATHTHA.M.V |
| 59 | ITDLH - NIVITHIGALA (INFORMATION TECHNOLOGY & DISTANCE LEARNING HUB) |
| 60 | R/NIVI KAHAWATHTHA M.M.V. |
| 61 | R/NIVI/ELAPATHA M.V. |
| 62 | R/NIVI/AYAGAMA SRI RAHULA M.M.V |
| 63 | KALAWANA N.S |
| 64 | R/NIVI/SUMANA M.V. |
| 65 | R/NIVI/ HANGAMUWA SRI RATHNODAYA V. |
| 66 | R/NIVI/ PEBOTUWA V. |

❖ අයදුම්පත පිරවීම සඳහා පහත පියවර අනුගමනය කරන්න.


පියවර 1.

https://sparkcoders.lk මඟින් හෝ QR කේතය ඔස්සේ වෙබ් පිටුවට පිවිසෙන්න.එවිට මෙලෙස දිස්වේ.





පියවර 2.

මෙහි REGISTER හෝ NEW REGISTER මත ක්ලික් (Click) කරන්න. එවිට පාඨමාලාව සඳහා අයදුම්කිරීමට අදාළ අයදුම්පත මේ ආකාරයට දිස්වේ.




පියවර 3.

මෙහි Full Name ලෙස සඳහන් සථානයේ අයදුම්කරුගේ සම්පූර්ණ නම ඉංග්‍රීසියෙන් සඳහන් කරන්න.





පියවර 4.

Gender ලෙස සඳහන් ස්ථානයේ අයදුම්කරුගේ ස්ත්‍රී පුරුෂ භාවය තෝරන්න





පියවර 5.

Date of Birth ලෙස සඳහන් සථානයේ අයදුම්කරුගේ උපන් දිනය හා Birth Certificate Number ලෙස සඳහන් ස්ථානයේ උප්පැන්න සහතික අංකය සඳහන් කරන්න.





පියවර 6.

මීලගට Student NIC Number යන ස්ථානයේ ජාතික හැඳුනුම්පත් අංකය ඇත්නම් පමණක් එය ඇතුළත් කරන්න.




පියවර 7.

Parents or Guardian Full Name යන ස්ථානයේ අයදුම්කරුගේ මව/පියා හෝ භාරකරුගේ සම්පූර්ණ නම සඳහන් කරන්න.



පියවර 8.

මෙහිදී Districts යන්නෙහි අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය තෝරා ගැනීමෙන් අනතුරුව අයදුම්කරු අයත් (Divisional Secretariat Office) යන්නෙහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද GN Division යන ස්ථානයෙන් අයදුම්කරුගේ පදිංචි ග්‍රාම නිළධාරී කොට්ඨාසය ද තෝරා ගත යුතුය.

Districts: Kegalle

Divisional Secretariat Office: Dehiovita

GN Division: Madola

පියවර 9.

මෙහි Home Address යන්නෙහි අයදුම්කරු වෙත තැපැල් ලිපි ලැබෙන ලිපිනය නිවැරදිව ඉංග්‍රීසියෙන් සඳහන් කළ යුතුය.

Address: 27/8, Royalty,Madola,Avissawella

පියවර 10.

මෙහි අයදුම්කරුගේ දුරකතන අංකය හා වට්ස්ඇප් අංකය සඳහන් කළ යුතුය. අයදුම්කරුට දුරකතන අංකය හා වට්ස්ඇප් අංකය නොමැත්නම් මව/පියා හෝ භාරකරුගේ අංක ඇතුළත් කළ හැකිය.

Personal Mobile Number: 0766988477

WhatsApp Number: 0766988477

පියවර 11.

මෙහිදී අයදුම්කරු විසින් තම පෞද්ගලික ඊ මේල් (e-mail) ලිපිනය සඳහන් කළ යුතුය.

Email: piumali@gmail.com

පියවර 12

මෙහි දී Zonal Education Office යන්නෙහි අයදුම්කරු ඉගෙනුම ලබන පාසල අයත් කලාපය තෝරාගත යුතු අතර Divisional Education Office හී දී ඉගෙනුම ලබන පාසල අයත් කොට්ඨාසය ද අනතුරුව ඉගෙනුම ලබන පාසල හා Present Grade යන්නෙහි අයදුම්කරු විසින් මේ වන විට ඉගෙනුම ලබන ශ්‍රේණිය තෝරාගත යුතු ය

Zonal Education Office: Dehiowita Zone


Divisional Education Office: Dehiowita Division

School: 24276-ATULUGAMA MAYADUNNA M.V.

Present grade: Grade-10

පියවර 13.

මෙහිදී අයදුම්කරු විසින් අ.පො.ස.සාමාන්‍ය පෙළ විභාගය (G.C.E. O/L) හෝ අ.පො.ස.උසස් පෙළ විභාගය (G.C.E. A/L) සඳහා තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය විෂය (Information & Communication Technology) හදාරා ඇත්නම් හෝ දැනට එම විෂය හදාරන්නේන්ම් YES ලෙස ද නැතිනම් NO ලෙස ද යොදන්න.




පියවර 14.

මෙහිදී Select the Nearest Training Center යන ස්ථානයේ අයදුම්කරුට පාඨමාලාව හැදෑරීමට පහසුවෙන්ම සම්බන්ධ විය හැකි මධ්‍යස්ථානය තෝරාගත යුතුය. දෙවනුව Language preferred ලෙස සඳහන් ස්ථානයේ අයදුම්කරු විසින් මෙම පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන භාෂා මාධ්‍යය නිවැරදිව තෝරා ගත යුතුය.




පියවර 15.

ඉහත සියලුම පියවර නැවත පරීක්ෂා කිරීමෙන් අනතුරුව අයදුම්කරු විසින් තම අයදුම් පතේ නිරවද්‍යතාවය පිළිබඳ තහවුරු කරගැනීමෙන් අනතුරුව මෙහි කළු පාටින් දක්වා ඇති REGISTER බටනය මත ක්ලික් කිරීමෙන් ඔබට මෙම පාඨමාලාව සඳහා සාර්ථකව අයදුම් කළ හැකි වේ.




පියවර 16.

අයදුම්කරු විසින් අයදුම්පත යොමු කිරීමෙන් අනතුරුව අයදුම්කරු පාඨමාලාවට සාර්ථකව ලියාපදිංචි වූ බව පහත පරිදි දිස්වන අතර එහි සඳහන් Download PDF බටනය මඟින් ඔබට අයදුම්පත භාගත කර ගැනීමට හැකිවේ.

